ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1989 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1989 මැයි මස 12 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි.    තැපැල් ගාස්තුව : ශත 75 යි

**1989 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 10/88

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1989 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නා.යෙ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතෙහි 17 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ 17අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 1980 අංක 44 දරන පනතෙහි 17අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"පරිපූරක නාමලේඛනය.

17අ. (1) 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත හෝ 1986 අංක 5 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත හෝ 1988 අංක 39 දරන අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත හෝ යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය ප්‍රදානය කිරීමේ හේතුවෙන් නාම ලේඛනයෙහි තමාගේ නාම ඇතුළත් කර ගැනීම සඳහා හිමිකම් පෑමට, 14(3) වන වගන්තියෙහි සඳහන් කාල සීමාව අවසන් වීමෙන් පසුව සුදුසුකම් ලබන යම් තැනැත්තකු විසින්, ඉකුත් වූ වර්ෂයේ ජූනි මස 1 වන දිනයෙහි එම තැනැත්තා පදිංචිව සිටියේ යම් මැතිවරණ කොට්ඨාසයක ද ඒ මැතිවරණ කොට්ඨාසයේ නාම ලේඛනයෙහි තමාගේ නම ඇතුළත් කර ගැනීම සඳහා ඊළඟ වර්ෂයේ මැයි මස 8 වන දිනට පෙර ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(2) ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ලැබුණු හිමිකම් පෑම්වල ලැයිස්තුවක් පිළියෙල කරනු ලැබිය යුතු අතර එම ලැයිස්තුව අවසන් කර ඇති බවටත්, එය දවසේ සියලු යුක්තිසහගත වේලාවල්වල පරීක්ෂණය සඳහා ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ කාර්යාලයෙහි තබා ඇති බවටත් ගැසට් පත්‍රයෙහි සහ එක් එක් ජාතික භාෂාවෙන් වූ යටත් පිරිසෙයින් එක් ප්‍රවෘත්ති පත්‍රයකින් දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

(3) හිමිකම් පෑමේ ලැයිස්තුවේ නම් සම්බන්ධයෙන් වූ විරෝධය පෑම් සහ එවැනි විරෝධතා පිළිබඳව ලියා පදිංචි කිරීමේ නිලධරයාගේ තීරණ වලට විරුද්ධව අභියාචනා කිරීම් සම්බන්ධයෙන්, 14 වන වගන්තියේ, (7) වන උපවගන්තියේ සිට (16) වන උපවගන්තිය දක්වා වූ උපවගන්තිවල සහ 15 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරන ලද විරෝධතා තීරණය කරනු ලැබීමෙන් පසු, හැකි තාක් ඉක්මණින්, එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින්, හිමිකම් පෑම් ලැයිස්තුවෙහි නම් දැක්වෙන්නේ යම් තැනැත්තන්ගේ ද, ඒ තැනැත්තන්ගේ නම් ඇතුළත් පරිපූරක නාම ලේඛනයක් පිළියෙල කොට, එය සහතික කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින්, අභියාචනයක් තීරණයට භාජනව පවත්නා කාලය තුළ දී පරිපූරක නාම ලේඛනය සහතික කරනු ලැබිය හැකි අතර, ඉන් ඉක්බිතිව, එම අභියාචනය තීරණය කිරීමේ දී, ප්‍රතිශෝධනය කරන නිලධරයාගේ තීරණයට අනුව, යම් තැනැත්තකුගේ නම, නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම හෝ එම නාම ලේඛනයෙන් ඉවත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(5) මැතිවරණ කොට්ඨාසයක් සඳහා පරිපූරක නාම ලේඛනය, (4) වන උපවගන්තිය යටතේ සහතික කරනු ලැබූ විට, එම පරිපූරක නාම ලේඛනය, එම මැතිවරණ කොට්ඨාසය සඳහා වූ නාම ලේඛනයෙහි කොටසක් ලෙස, සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම, 1991 මැයි මස 31 වන දින සිට අවසන් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි " 15 (4) වන වගන්තිය හෝ 18 වන වගන්තිය හෝ අනුව " යන වචන සහ ඉලක්කම් වෙනුවට " 15 (4) වන වගන්තිය හෝ 17අ වගන්තිය හෝ 18 වන වගන්තිය හෝ අනුව " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "15 වන වගන්තිය හෝ 22 වන වගන්තිය හෝ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "15 වන වගන්තිය හෝ 17අ වගන්තිය හෝ 22 වන වගන්තිය හෝ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) "15 වන වගන්තිය යටතේ ඒ නාම ලේඛනයෙන් ඉවත් කරනු ලැබූ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "15 වන වගන්තිය හෝ 17අ වගන්තිය හෝ යටතේ ඒ නාම ලේඛනයෙන් ඉවත් කරනු ලැබූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.